# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## ශාස්ත්‍ර පීඨය

**සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය (දෑ අවුරුදු) 2016/2018 සහ සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය (එක් අවුරුදු) 2016/2017**

**දෙවන සෙමෙස්තරය**

**MAS 604 - කෘෂිකාර්මික සමාජය පිළිබඳ සමාජ විද්‍යාව**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න**

*කාලය : පැ (03) තුනයි*

---

1. සමකාලීන ග්‍රාමීය සමාජය හා සම්බන්ධයෙන් 'ගැමියන් ' පිළිබඳව ඇති විවිධ නිර්වචනවල අදාලත්වය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

2. ගැමි සමාජ විභේදායනය පිළිබඳව ඇති න්‍යායාත්මක පර්යාවලෝක විවේචනාත්මකව විභාග කරන්න.

3. ශ්‍රී ලංකාවේ පශ්චාත් යටත් විජිත ග්‍රාමීය සමාජ ආර්ථික සැකැස්ම කෙරෙහි බ්‍රිතාන්‍ය යටත් විජිතවාදය විසින් සිදුකරන ලද බලපෑම නිව්ටන් ගුණසිංහ සහ කුමාරි ජයවර්ධනගේ අදහස් ඇසුරින් සාකච්ඡා කරන්න.

4. 'කෘෂිකර්මාන්තය නවීකරණය කිරීමේදී හරිත විප්ලවය හඳුන්වාදීම තුළ පාරිසරික අනාරක්ෂිතභාවයක් පමණක් නොව සමාජ-ආර්ථික සහ දේශපාලන අනාරක්ෂිතභාවයක් ද කෘෂිකාර්මික සමාජ තුළ ඇති කරන ලදි.' ඉහත ප්‍රකාශයට අවධානය යොමුකරමින් වන්දනා ශිවා විසින් හරිත විප්ලවය පිළිබඳ කතිකාවට දැක්වූ විවේචනය ඇගේ "The Viloence of the Green Revloution" යන අධ්‍යයනය ඇසුරින් සාකච්ඡා කරන්න.

5. ග්‍රාමීය සමාජ නායකත්වය සාම්ප්‍රදායික නායකයින්ගේ සිට දේශපාලන ආධාරකරුවන් අතට පත්වීම දක්වා වන වෙනස්වීම තමාරා ගුණසේකරගේ "The Contemporary Power Hierarchy" යන ලිපිය ඇසුරින් විභාග කරන්න.

අ.පි.බ.

6. 'ග්‍රාමීය ප්‍රජාව තුළ පුද්ගල හැසිරීම නියාමනය කිරීමේදී සාම්ප්‍රදායික ග්‍රාමීය සමාජයේ 'ප්‍රජාව' වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදි. එනමුත් වර්තමානයේ එම කාර්යභාරය රාජ්‍යය සහ සංවර්ධන විශේෂඥයින් විසින් අත්පත් කරගෙන ඇත. මෙම ප්‍රකාශය ආර්. එම්. රණවීර බණ්ඩාගේ "Transnational culture and Expert knowledge: Response from a rural community in Sri Lanka" යන අධ්‍යනය ඇසුරෙන් විවේචනාත්මකව විභාග කරන්න.

7. සමකාලීන ග්‍රාමීය කෘෂි ආර්ථිකය සෘජුවම ගෝලීය වෙළඳපොළට සම්බන්ධ කිරීම සඳහා 'අපනයන නිෂ්පාදන ගම්මාන ක්‍රමය' විසින් සපයන දායකත්වය පියදාස රත්නායකගේ An alternative approach for the Survival Agricultural Co-operative Movement under the Open Market Policy' යන ලිපිය ඇසුරින් විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

8. වර්තමාන ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලියේදී රාජ්‍ය නොවන සංවිධානවල කාර්යභාරය Damoar Suar, Laxmi Bilash Hota Himadri Sinha ගේ Non-Government Organizations in Rural Development' යන ලිපිය ඇසුරින් සාකච්ඡා කරන්න.

*****************